# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2411/51 - 2024 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2024.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

යොමු අංකය: WGSWD&EIP/ACQ/KB/32.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/10/2016/LRB/29.

වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෙල්ලන්තර හික්ගහවත්ත පාරේ කාණු පද්ධතිය බෙල්ලන්විල වැවට සම්බන්ධ කිරීම සඳහා අලුතින් ඇළ මාර්ගයක් ඉදිකිරීමට ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගන්නා ලද ඉඩම් විස්තරය*:-

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 535A, බෙල්ලන්විල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළකර ඇති 2024.10.16 දිනැති අංක 521216 දරන කැඩැස්තර සිතියමේ 02 වැනි කලාපයේ පත්‍ර අංක 01හි, පහත අංකනය කර පෙන්වා ඇති බිම් කොටස්:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: දංගහඕවිට; විස්තරය: ඇළ සහ විවෘත බිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0201

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: දංගහඕවිට; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0035

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: -; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0042

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.12.27 වැනි දින පෙ.ව. 10.00 ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ. අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2024.12.20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවය එකී

ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2024 නොවැම්බර් මස 20 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 11 - 0139

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

යොමු අංකය: WGSWD&EIP/ACQ/KB/06.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/10/2012/LRB/22.

වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, බෙල්ලන්විල ප්‍රදේශයේ ජල රක්ෂිතයක් සකස් කිරීම පිණිස කටු ඇළ හා බෝධිරාජ මාවත අතර පිහිටි ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගන්නා ලද ඉඩමේ විස්තරය*:-

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 533F, බොරලැස්ගමුව බටහිර C, 535B දිවුල්පිටිය බටහිර හා 535A බෙල්ලන්විල යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කර ඇති 2024.10.16 දිනැති අංක 521219 කැඩැස්තර සිතියමේ 01 වැනි කලාපයේ පත්‍ර අංක 1හි, පහත අංකනය කර පෙන්වා ඇති බිම් කොටස්:

1. **කැබලි අංක 01**
ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: වැව, ඇවිදින මංතීරුව, ඇළ සහ මාර්ගය (ශ්‍රී මහා බෝධිරාජාරාම පාර); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ගීතානි ආතාවුද පතිරන මිය, අංක 36, පන්සල පාර, දිවුලිපිටිය, බොරලැස්ගමුව. ආර්. ඒ. සී. අබේසිංහ මයා, සී. ඩී. ජයකොඩි මයා, එල්. එස්. ජයවර්ධන මයා, අංක 07, දෙවන පටුමග, බෙල්ලන්තර පාර, දෙහිවල. ඩබ්. එම්. චමිලා දර්ශනී විජේසේන මිය, අංක 10/8, වික්‍රමරත්න මාවත, කොහුවල, නුගේගොඩ. එස්. පී. ආර්. ඩයස් මයා, අංක 128, දිවුල්පිටිය, බොරලැස්ගමුව. ටී. කේ. ජගත් වීරසිංහ මයා, අංක 64බී, විහාර මාවත, බෙල්ලන්විල, බොරලැස්ගමුව. ඩබ්. එස්. ටී. සම්පත් නීල් පෙරේරා මයා, අංක 10/4, ගාලු පාර, දෙහිවල. ආර්. එම්. ගමගේ මයා, අංක 14/9/ඩී, මහරගම පාර, මකුළුදූව . ලිලංගා හසිනි ප්‍රනාන්දු බටවලගේ මිය, අංක 42/2, පල්ලිදොර පාර, දෙහිවල; ප්‍රමාණය: හෙක්. 7.5549

2. **කැබලි අංක 02**
ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: ඇවිදින මංතීරුව, ඇළ සහ මාර්ගය (ශ්‍රී මහා බෝධිරාජාරාම පාර); හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ටී. කේ. ජගත් වීරසිංහ මයා, අංක 64බී, විහාර මාවත, බෙල්ලන්විල, බොරලැස්ගමුව; ප්‍රමාණය: හෙක්. 0.0475

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024.12.26 වැනි දින පෙ.ව. 10.00ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ. අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2024.12.19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2024 නොවැම්බර් මස 20 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 11 - 0140

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.